# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2044/21 - 2017 නොවැම්බර් මස 07 වන අඟහරුවාදා - 2017.11.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වන කොටස: (I) වන ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2006 අංක 11 දරන මුදල් පනත

2006 අංක 11 දරන මුදල් පනතේ 8 වැනි වගන්තිය සමග කියවෙන එකී පනතේ 6 (2) වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය මංගල සමරවීර වන මම, මෙම නියමය මගින් පහත සඳහන් නියෝග ප්‍රකාශයට පත් කරමි. මෙම නියෝග 2017 නොවැම්බර් මස 08 වැනි දින සිට බලපැවැත්වේ.

මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය.

2017 නොවැම්බර් මස 07 වන දින,
කොළඹ 01,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ දී ය.

නියෝග

1. මෙම නියෝග, 2017 අංක 1 දරන මුදල් (ටෙලිනාට්‍ය, චිත්‍රපට සහ වාණිජ වැඩසටහන් බද්ද) නියෝග ලෙස හඳුන්වනු ලැබිය හැකිය.

2. 2006 අංක 11 දරන මුදල් පනතේ 8 වන වගන්තිය යටතේ 2006 ජූනි මස 29 වැනි දිනැති අංක 1451/16 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*, 2006 ජූලි මස 24 වැනි දිනැති අංක 1455/6 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* සහ 2006 ඔක්තෝබර් මස 05 වැනි දිනැති අංක 1465/21 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කරනු ලැබූ මුදල් (ටෙලිනාට්‍ය, චිත්‍රපට සහ වාණිජ වැඩසටහන් බද්ද) නියෝග මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.


1A - PG 3744 — 557 (2017/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3. 2006 අංක 11 දරන මුදල් පනතේ II වන කොටස (මෙහි මින් මතු "පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) මගින් පනවනු ලබන සහ "ලේකම්" විසින් අයකරනු ලබන ටෙලිනාට්‍ය, චිත්‍රපට සහ වාණිජ වැඩසටහන් බද්ද (මෙහි මින් මතු "බද්ද" යනුවෙන් අදහස් කරනු ලබන), මෙම නියෝග ක්‍රියාත්මක වන දින සහ ඉන් පසුවට,

(අ) සෑම ටෙලිනාට්‍යයක් හෝ චිත්‍රපටයක් සම්බන්ධයෙන් එම ටෙලිනාට්‍යයේ හෝ චිත්‍රපටියේ විකාශන කාලයට අනුරූපව මෙම නියෝගයන්හි I වන උපලේඛනයේ (i) වන කොටසෙහි දක්වා ඇති අනුප්‍රමාණයන්ට අනුව ; සහ

(ආ) සෑම වාණිජ වැඩසටහනක් සම්බන්ධයෙන් මෙම නියෝගයන්හි I වන උපලේඛනයේ (ii) වන කොටසෙහි දක්වා ඇති අනුප්‍රමාණයන්ට අනුව පනවනු ලැබිය යුතුය.

4. ඉහත පරිදි අයකරනු ලබන බද්ද එකතු කරනු ලබන දින සිට දින 15ක් තුළ රජයේ ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතුය.

5. මෙම නියෝගවල 13 වැනි නියෝගයෙහි විධිවිධාන වලට අනුකූලව ලේකම්වරයා විසින් නිකුත් කරනු ලැබූ නිෂ්කාශන සහතිකයක් නොලබා කිසිදු බලපත්‍රලාභී ආයතනයක් විසින් යම් ටෙලිනාට්‍යයක්, චිත්‍රපටියක් හෝ වාණිජ වැඩසටහනක් විකාශය නොකළ යුතුය.

යම් ටෙලිනාට්‍යයක්, චිත්‍රපටියක් හෝ වාණිජ වැඩසටහනක් ශ්‍රී ලාංකීය ගති සිරිත්, අනන්‍යතාවය සහ ආචාර ධර්මවලට එරෙහි වනු ඇතැයි ලේකම්වරයාගේ මතය වන අවස්ථාවක, එම ටෙලිනාට්‍ය, චිත්‍රපටිය හෝ වාණිජ වැඩසටහන විකාශය කිරීමේ උචිත හෝ අනුචිත බව පිළිබඳව තීරණයක් දෙන ලෙස ඉල්ලා සිටිමින් මෙම නියෝගයන්හි අංක 11 දරන නියෝගයෙහි සඳහන් මඬුල්ල වෙත ඔහු විසින් යොමු කරනු ලැබිය හැකිය. එම ටෙලිනාට්‍ය, චිත්‍රපටිය හෝ වාණිජ වැඩසටහන විකාශය කිරීම උචිත නොවෙතැයි එම මඬුල්ල තීරණය කරන්නේ නම් ලේකම්වරයා විසින් එම නිෂ්කාශන සහතිකය නිකුත් කිරීම ප්‍රතික්ෂේප කළ යුතු අතර, ඒ බව ලිඛිතව එම ආයතනය වෙත දන්විය යුතුය. එසේවුවද, මණ්ඩලයට සුදුසු යැයි හැඟීයන්නා වූ යම් කොන්දේසි වලට අනුගතව ක්‍රියා කිරීමට යම් ආයතනයකට නියම කළ අවස්ථාවකදී එම ආයතන එම නියමයන්ට අනුගතව ක්‍රියා කිරීමට එකඟ වන්නේ නම් ලේකම්වරයා විසින් එම ප්‍රතික්ෂේප කිරීමට විකල්පයක් වශයෙන් එම කොන්දේසි විශේෂිත කොට දක්වමින් නිෂ්කාශන සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු අතර, එම නියමයන්ට අනුගතව ක්‍රියා කිරීම එම ආයතනයේ වගකීම වේ.

6. පුද්ගලයන් තිහකට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත සම්පත්ධාරී පුද්ගල කණ්ඩායමක් ලේකම්වරයා විසින් අදාළ රේඛීය අමාත්‍යාංශයන්හි ලේකම්වරුන් හා සමග සාකච්ඡා කර පනතේ කාර්යයන් සඳහා පත් කරනු ලැබිය යුතුය. මෙම සම්පත්ධාරී පුද්ගල කණ්ඩායම චිත්‍රපට, රූපවාහිනිය, සාහිත්‍යය, භාෂාව, විද්‍යාව, ඉතිහාසය, මනෝවිද්‍යාව, නීතිය හා ශ්‍රී ලාංකීය සංස්කෘතිය වැනි ක්ෂේත්‍රයන්හි නිපුනතාවයක් ඇති පුද්ගලයන් අතරින් තෝරාගත්තවුන් විය යුතුය.

7. (1) (අ) බද්ද ගෙවිය යුතු යැයි බලපත්‍රලත් ආයතනයක් විසින් ස්වකීය වූ තීරණයක් මත අදහස් කරන විටදී ;

හෝ

(ආ) 8 වැනි නියෝගයට අනුව බදු නිදහසක් ලැබීමට එම ටෙලිනාට්‍ය හෝ චිත්‍රපටිය සුදුසු නොවන බැවින් 12 වැනි නියෝගය යටතේ නිකුත් කරනු ලැබූ සහතිකයකින් එම බලපත්‍රලත් ආයතනය බද්ද ගෙවිය යුතු බවට ප්‍රකාශ වන අවස්ථාවක දී,

යම් ටෙලිනාට්‍යයක් හෝ චිත්‍රපටයක් විකාශය කිරීමට අපේක්ෂා කරන සෑම බලපත්‍රලත් ආයතනයක් විසින්ම මෙම නියෝගවල I වන උපලේඛනයේ (i) වන කොටසෙහි දක්වා ඇති අනුප්‍රමාණයන්ට අනුව බද්ද වහාම ගෙවිය යුතුවේ.

(2) (අ) යම් බලපත්‍රලාභී ආයතනයක් විසින් යම් වාණිජ වැඩසටහනක් විකාශය කිරීමට පෙර මෙම නියෝගවල I වන උපලේඛනයේ (ii) වන කොටසෙහි දක්වා ඇති අනුප්‍රමාණයන්ට අනුව බද්ද වහාම ගෙවිය යුතුවේ.

(ආ) යම් බලපත්‍රලාභී ආයතනයක් (පළමුව සඳහන් බලපත්‍රලාභී ආයතනය) විසින් ගෙවන ලද බද්ද, පළමුව සඳහන් බලපත්‍රලාභී ආයතනය විසින් තත්කාර්යය සඳහා නම් කරනු ලැබූ වෙන යම් බලපත්‍රලාභී ආයතනයක් (නම් කරන ලද බලපත්‍රලාභී ආයතනය) විසින් ද ගෙවන ලද සේ සළකනු ලැබිය යුතු අතර, එම නම් කරන ලද බලපත්‍රලාභී ආයතනය මෙම නියෝගවල පරිදි ඉදිරි පියවර ගත යුතුවේ. ඒ අනුව, නම් කරන ලද බලපත්‍රලාභී ආයතනය විසින් අදාළ බද්ද ගෙවා ඇති බවට, නම් කරන ලද බලපත්‍රලාභී ආයතනය විසින් ඉදිරිපත් කරනු ලබන එම නියෝගයේ සඳහන් ප්‍රකාශය, ලේකම්වරයා විසින් පිළිගනු ලැබිය යුතුය.

8. යම් ටෙලිනාට්‍යයක් හෝ චිත්‍රපටියක් විකාශය කිරීමට අපේක්ෂා කරන සෑම බලපත්‍රලත් ආයතනයක්ම එම ටෙලිනාට්‍ය හෝ චිත්‍රපටය පහත සඳහන් යම් කාණ්ඩයකට හෝ කාණ්ඩ කීපයකට අයත්වීමේ හේතුවෙන් බද්දට යටත් නොවෙතැයි එම බලපත්‍රලත්

ආයතනය අදහස් කරන්නේ නම් එම ටෙලිනාට්‍යය හෝ චිත්‍රපටය, පනතේ 6 වන වගන්තියේ (1) වන උප වගන්තියේ අතුරු විධාන යටතේ බද්ද ගෙවීමෙන් නිදහස් කිරීම සඳහා ඉල්ලුම් කිරීමට හිමිකම් ඇත.

(අ) වාර්තා වැඩසටහන් ; හෝ

(ආ) අධ්‍යාපනික වැඩසටහන් ; හෝ

(ඇ) ළමයින්ට විනෝදය සැපයීම සඳහා වන වැඩසටහන් ; හෝ

(ඈ) අනෙකුත් නිර්දේශිත කාණ්ඩ :

i. ආගමික වැඩසටහන් ;

ii. යම් ජාත්‍යන්තර හෝ කලාපීය සිදුවීමක් ;

iii. මුල් පිටපත සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාවෙන් නිෂ්පාදනය කරනු ලැබූ සහ හඬ නොකැවූ යම් ටෙලිනාට්‍යයක් හෝ චිත්‍රපටයක් ;

iv. ටෙලිනාට්‍යයක හෝ චිත්‍රපටයක ප්‍රධාන චරිත හා නිෂ්පාදන කාර්යය මණ්ඩලයේ බහුතරය ශ්‍රී ලාංකික පුරවැසියන් වන යම් චිත්‍රපටයක් හෝ ටෙලි නාට්‍යයක්.

"මෙම නියෝගයේ කාර්යයන් සඳහා,

(i) "ප්‍රධාන චරිත" යන්නෙන් ප්‍රධාන නළුවා, ප්‍රධාන නිළිය, සහාය නළුවා සහ සහාය නිළිය ද ඇතුළුව වෙනත් ප්‍රධාන චරිත රඟපාන නළුනිළියන් අදහස් වේ.

(ii) යම් ටෙලි නාට්‍යයක හෝ චිත්‍රපටයක අධ්‍යක්ෂ, සහාය අධ්‍යක්ෂ, සංගීත අධ්‍යක්ෂ, ප්‍රධාන කැමරා ශිල්පී, තිර රචක, ප්‍රධාන සංස්කාරක, ප්‍රධාන පසුබිම් ගායක සහ ප්‍රධාන පසුබිම් ගායිකාව ඇතුළුව නිෂ්පාදන කාර්යය මඬුල්ලෙන් අඩකට වඩා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් සමන්විත වන්නේ නම් එම ටෙලිනාට්‍යයේ හෝ චිත්‍රපටයේ නිෂ්පාදන කාර්යය මඬුල්ලෙහි බහුතරය ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් සමන්විත වන ලෙස සැලකිය යුතුය."

9. යම් ටෙලිනාට්‍යයක් හෝ චිත්‍රපටයක් විකාශය කිරීමට අපේක්ෂා කරන යම් බලපත්‍රලත් ආයතනයක් මෙම නියෝගයන්හි 8 වන නියෝගය යටතේ බදු නිදහස සඳහා ඉල්ලුම් කරන්නේ නම් මෙම නියෝගවල II වන උපලේඛනයේ දැක්වෙන ආදර්ශ ආකෘතියට අනුව ලේකම්වරයා වෙත ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කළ යුතු වේ.

10. එවැනි ඉල්ලුම්පතක් ලද විට, එම ටෙලිනාට්‍ය හෝ චිත්‍රපටිය 8 වැනි නියෝගය අනුව බද්දෙන් නිදහස් වන්නේ ද/නොවන්නේ ද යන්න තීරණය කරනු සඳහා 11 වැනි නියෝගය අනුව ස්ථාපනය කරනු ලබන මඬුල්ලක් වෙත ලේකම්වරයා විසින් එම ඉල්ලුම්පත්‍රය යොමු කළ යුතුය.

11. 9 වැනි නියෝගය යටතේ ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම්පත් සලකා බලා ඒ සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සඳහා 6 වන නියෝගය යටතේ පත් කරන ලද නිපුණතාවයෙන් යුත් පුද්ගල කණ්ඩායමේ සාමාජිකයින් අතරින් 3 දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත මඬුළු, ලේකම්වරයා විසින් නම් කළ යුතුය. එම මණ්ඩලයේ සාමාජිකයින් අතරින් එක් අයෙකු මණ්ඩලයේ සභාපති ලෙස නම් කරනු ලැබේ. මඬුල්ලක් තෝරා ගැනීමේදී, ලේකම්වරයා විසින් විෂයානුගත විශේෂඥතාවය කෙරෙහි සැලකිලිමත් වනු ඇත.

12. යම් මඬුල්ලක් වෙත යොමු කරනු ලැබූ ටෙලිනාට්‍යයක් හෝ චිත්‍රපටයක් මෙම නියෝගයන්හි 8 වැනි නියෝගය අනුව බදු නිදහසට සුදුසුකම් ලබන්නේදැයි එම මඬුල්ල විසින් තීරණය කළ යුතුය. තමන් වෙත යොමු කරනු ලැබූ කාරණය ගැන තීරණයක් කිරීමෙන් අනතුරුව මෙම නියෝගයන් හි III වැනි උපලේඛනයෙහි දක්වා ඇති ආකෘතිය අනුව වූ සහතිකයක් මගින් මඬුල්ල විසින් තම තීරණය ලේකම්වරයා වෙත ඉදිරිපත් කල යුතුය. මඬුල්ලේ තීරණය, අවසාන තීරණය වේ.

12 (අ). නියෝග 5 හෝ නියෝග 12 යටතේ පත්කර ඇති මඬුල්ල විසින් දෙන ලද තීරණය පිළිබඳව අතෘප්තියට පත් යම් බලපත්‍රලාභී ආයතනයකට, එම තීරණය එකී ආයතනයට දැනුම් දුන් දින සිට දින 14ක් ඇතුළත එකී තීරණයට එරෙහිව අභියාචන මණ්ඩලයට අභියාචනයක් ඉදිරිපත් කළ හැක. අභියාචනය ලිඛිතව ඉදිරිපත් කළ යුතු වන අතර, අභියාචනය සඳහා හේතු සාධක වූ කරුණු ඇතුළත් විය යුතු වේ. අභියාචනා මණ්ඩලය එවැනි අභියාචනයක් ලැබී දින 15ක් අතුළත එකී අභියාචනය විභාගයට ගෙන තීරණයක් ලබා දෙනු ඇත.

මෙම නියෝගයෙහි කාර්යයන් සඳහා "අභියාචනා මණ්ඩලය" යන්නෙන් ලේකම්වරයා සහ 6 වන නියෝගයේ දක්වෙන කුසලතා පූර්ණ කණ්ඩායමක් අතරින් ලේකම්වරයා විසින් තෝරා ගනු ලබන තවත් සිව් දෙනෙකු සාමාජිකයන් වන මණ්ඩලයක් අදහස් වේ. එහෙත් අභියාචනයට බඳුන් වී ඇති තීරණය ලබා දුන් මඬුල්ලේ සාමාජිකයෙකු වන යම් කුසලතා පූර්ණ පුද්ගලයෙකු අභියාචනා මණ්ඩලයේ සාමාජිකයෙකු නොවිය යුතුය. ලේකම්වරයා අභියාචනා මණ්ඩලයේ සභාපතිවරයා විය යුතුය. ලේකම්වරයා විසින් එම බලපත්‍රලාභී ආයතනය වෙත දැන්විය යුතු එම අභියාචනා මණ්ඩලයේ තීරණය, මෙම නියෝගයෙහි කාර්යයන් සඳහා අවසාන හා තීරණාත්මක විය යුතුය.

13. යම් ටෙලිනාට්‍යයක්, චිත්‍රපටයක් හෝ වාණිජ වැඩසටහනක් සම්බන්ධයෙන් මෙම නියෝගයන් හි 7 වැනි නියෝගයෙහි විධිවිධාන පරිදි බද්ද ගෙවා ඇති සෑම බලපත්‍රලාභී ආයතනයක්ම, අවස්ථානුකූල පරිදි ප්‍රකාශිත කාලසීමාව සඳහා, යම් ටෙලිනාට්‍යයක හෝ චිත්‍රපටයක හෝ වාණිජ වැඩසටහනක පළමු විකාශයට හෝ එහි යම් කොටසක් විකාශය කිරීමට අපේක්ෂිත දිනට සති දෙකකට නොඅඩු කාලයකට පෙර මෙම නියෝගයන්හි IV වන උපලේඛනයෙහි දක්වා ඇති ආකෘතියට අනුව වන ලිඛිත ප්‍රකාශයක් ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය. ප්‍රකාශය ලැබීමෙන් පසු එහි සිද්ධිමය කරුණු සම්බන්ධයෙන් සෑහීමට පත්වන්නේ නම් මෙම නියෝගවල V වැනි උපලේඛනයෙහි දක්වා ඇති ආකෘතියට අනුව වූ නිෂ්කාශන සහතිකයක් ලේකම්වරයා විසින් බලපත්‍රලාභී ආයතනය වෙත නිකුත් කළ යුතුය.

14. මෙම නියෝග යටතේ තීරණ ගැනීමේ කාර්යය සඳහා මඬුළු විසින් සැලකිල්ලට ගත යුතු පොදු නියමයන් අඩංගු මාර්ගෝපදේශ, ලේකම්වරයා විසින් විටින් විට නිකුත් කරනු ලැබිය යුතුය.

15. මෙම නියෝගවල කාර්යයන් සඳහා,

"බලපත්‍රලාභී ආයතනයක්" යනු 1982 අංක 6 දරන ශ්‍රී ලංකා රූපවාහිනී පනත යටතේ හෝ කලින් කලට අධිකාරිය දෙනු ලබන බලපත්‍ර නිකුත් කිරීමේ අධිකාරියකින් බලපත්‍රයක් ලබා ඇති ආයතනයකි ;

"ලේකම්වරයා" යන්නෙන් ජනමාධ්‍ය විෂය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස් වේ ;

"ටෙලිනාට්‍ය, චිත්‍රපට හෝ වාණිජ වැඩසටහන්" යන්නෙන් ශ්‍රී ලංකාවෙන් පිටත දී සාදන ලද හෝ චිත්‍රපට ගත කරන ලද සහ විකාශය කිරීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාවට රැගෙන එනු ලැබූ හෝ ආනයනය කරනු ලැබූ ටෙලිනාට්‍ය, චිත්‍රපට හෝ වාණිජ වැඩසටහන් අදහස් කෙරේ.

## උපලේඛනය I

(නියෝග 3 සහ 7)

2006 අංක 11 දරන මුදල් පනත

**ටෙලිනාට්‍ය, චිත්‍රපට හා වාණිජ වැඩසටහන් බද්ද**

ටෙලිනාට්‍ය, චිත්‍රපට හා වාණිජ වැඩසටහන් සම්බන්ධයෙන් ගෙවිය යුතු බදු අනුප්‍රමාණයන්

(i) කොටස

| වර්ගය | | | විකාශිත කාලය | අනුප්‍රමාණය (රු.) |
|---|---|---|---|---|
| සිංහල හෝ දෙමළ භාෂාවෙන් හඬ කවන ලද ටෙලිනාට්‍ය හෝ චිත්‍රපට | (අ) | | පළමු විකාශය, සෑම විනාඩි 30ක් හෝ ඊට අඩු කාල පරිච්ඡේදයක් සඳහා | |
| | | (i) | දිනකට පළමු විකාශන කාල පරිච්ඡේද 04 සඳහා | 150,000 |
| | | (ii) | එක් දිනකට එම පළමු විකාශන කාල පරිච්ඡේද 04න් පසු එළඹෙන විකාශන කාල පරිච්ඡේද 04 සඳහා | 250,000 |
| | | (iii) | එක් දිනකට අනෙකුත් විකාශන කාල පරිච්ඡේද සඳහා | 350,000 |
| | (ආ) | | නැවත විකාශය, සෑම විනාඩි 30ක් හෝ ඊට අඩු කාල පරිච්ඡේදයක් සඳහා | |
| | | (i) | දිනකට පළමු විකාශන කාල පරිච්ඡේද 04 සඳහා | 50,000 |
| | | (ii) | එක් දිනකට එම පළමු විකාශන කාල පරිච්ඡේද 04න් පසු එළඹෙන විකාශන කාල පරිච්ඡේද 04 සඳහා | 80,000 |
| | | (iii) | එක් දිනකට අනෙකුත් විකාශන කාල පරිච්ඡේද සඳහා | 120,000 |
| වෙනත් ටෙලිනාට්‍ය (පළමු විකාශය හෝ නැවත විකාශය) | | | සෑම විනාඩි 30ක් හෝ ඊට අඩු කාල පරිච්ඡේදයක් සඳහා | 100,000 |
| වෙනත් චිත්‍රපට | (අ) | | පළමු විකාශය | 200,000 |
| | (ආ) | | නැවත විකාශය | 100,000 |

(ii) වන කොටස

| වර්ගය | | විකාශිත කාලය | අනුප්‍රමාණය (රු.) |
|---|---|---|---|
| වාණිජ වැඩසටහන් | | යම් බලපත්‍රලාභී ආයතනයක් විසින් නිෂ්කාශන සහතිකයේ සඳහන් දින සිට යම් වාර ගණනක් විකාශය කිරීම සඳහා, | |
| | (i) | නිෂ්කාශන සහතිකයේ සඳහන් දින සිට දින 183ක කාල පරිච්ඡේදයක් සඳහා | 500,000 |
| | (ii) | නිෂ්කාශන සහතිකයේ සඳහන් දින සිට දින 365ක කාල පරිච්ඡේදයක් සඳහා | 1000,000 |

උපලේඛනය II

(නියෝගය 9)

2006 අංක 11 දරන මුදල් පනත

ටෙලිනාට්‍ය, චිත්‍රපට හා වාණිජ වැඩ සටහන් බද්ද

සහතිකයක් සඳහා ඉල්ලුම් පත්‍රය

1. බලපත්‍රලත් ආයතනයේ නම : ..........................................................................

..........................................................................

2. ලිපිනය : ..........................................................................

..........................................................................

3. දුරකථන/ෆැක්ස් අංක : ..........................................................................

4. විකාශය කිරීමට අපේක්ෂිත ටෙලි නාට්‍යයේ/චිත්‍රපටයේ නම : ..........................................................................

..........................................................................

5. බදු නිදහස ඉල්ලා සිටින්නේ කවර නිදහස් කිරීමේ හේතුවක් මත ද යන වග : ..........................................................................

..........................................................................

6. බදු නිදහස සඳහා වන ඉල්ලීම සනාථ කිරීම සඳහා ඇති හේතු (වෙනම ලේඛන අමුනන්න) : ..........................................................................

..........................................................................

ඉහත දක්වෙන තොරතරු සත්‍ය සහ නිවැරදි බව ප්‍රකාශ කරමි. ඉහත 4හි සඳහන් ටෙලි නාට්‍යයේ/චිත්‍රපටයේ පිටපතක් මේ සමග ඉදිරිපත් කරමි.

..........................................

ප්‍රකාශකයගේ අත්සන.

ප්‍රකාශකයගේ නම : ..........................................................................

ප්‍රකාශකයගේ තනතුර : ..........................................................................

දිනය : ..........................................................................

උපලේඛනය III

(නියෝගය 12)

2006 අංක 11 දරන මුදල් පනත

ටෙලිනාට්‍ය, චිත්‍රපට හා වාණිජ වැඩසටහන් බද්ද

# සහතික පත්‍රය

සහතිකයේ අනුක්‍රමික අංකය : ..................................

ලේකම්,
මාධ්‍ය කටයුතු අමාත්‍යාංශය,

බලපත්‍රලත් ආයතනයේ නම : ..........................................................................................................

ටෙලිනාට්‍යයේ/චිත්‍රපටයේ නම : ..........................................................................................................

ඉහත සඳහන් ටෙලිනාට්‍ය/චිත්‍රපටය,

(අ) රෙගුලාසි අංක 8 යටතේ නිදහස් කිරීමකට සුදුසු නොවන හෙයින් අදාළ බද්ද ගෙවීමට අවශ්‍ය බවට ;

හෝ

(ආ) රෙගුලාසි අංක 8 යටතේ නිදහස් කිරීමකට සුදුසු වන හෙයින් අදාළ බද්ද ගෙවීමට අනවශ්‍ය බවට ;

පහත නම් සඳහන් මඬුල්ලේ සාමාජිකයින් වන අප සෑහීමකට පත් වන බව මෙයින් සහතික කරනු ලැබේ.

*මඬුල්ලේ සාමාජිකයින් :*

| නම | අත්සන |
|---|---|
| .......................................................................... | .......................................... |
| .......................................................................... | .......................................... |
| .......................................................................... | .......................................... |

දිනය : ..........................................

(අනවශ්‍ය වචන කපා හරින්න)

උපලේඛනය IV

(නියෝගය 13)

*2006 අංක 11 දරන මුදල් පනත*

ටෙලිනාට්‍ය, චිත්‍රපට හා වාණිජ වැඩසටහන් බද්ද

## ප්‍රකාශය

*(අදාළ වන පරිදි (i) හෝ (ii) කොටස පුරවන්න)*

### (i) වන කොටස)

ටෙලිනාට්‍ය සහ චිත්‍රපට

| ටෙලිනාට්‍යයේ හෝ චිත්‍රපටියේ නම | බද්දට යටත් වන/නොවන බව | විකාශය කිරීමට අදාළ මුළු කාලය | *විකාශය කිරීමට අදාළ මුළු කාල පරිච්ඡේදය | බද්දට යටත් නම් ගෙවූ මුළු බදු මුදල (රු.) |
|---|---|---|---|---|
| 1. | | | | |
| 2. | | | | |
| 3. | | | | |

* විකාශයට යෝජිත මුළු කාල පරිච්ඡේදය දින/මාස/අවුරුද්ද සහිතව සඳහන් කරන්න.

### (ii) වන කොටස)

වාණිජ වැඩසටහන්

| වාණිජ වැඩසටහනේ අනන්‍යතාව | විකාශය කිරීමට අදාළ මුළු කාලය | *විකාශය කිරීමට අදාළ මුළු කාල පරිච්ඡේදය | ගෙවූ මුළු බදු මුදල (රු.) |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |

* විකාශයට යෝජිත මුළු කාල පරිච්ඡේදය දින/මාස/අවුරුද්ද සහිතව සඳහන් කරන්න.

ඉහතින් සඳහන් කර ඇති සියලුම ටෙලිනාට්‍යය/චිත්‍රපට/වාණිජ වැඩසටහන් සම්බන්ධයෙන්,

(අ) මෙම නියෝගය යටතේ විකාශය කිරීම සඳහා අදාළ සියලු බදු මුදල් ගෙවා ඇත ;

හෝ

(ආ) නියෝග 12 යටතේ නිදහස් කිරීමක් ලබා දී ඇත, සහ

(ඇ) (i) බද්ද ගෙවූ බව තහවුරු කෙරෙන ගෙවීම් පත්‍රිකා ;

හෝ

(ii) නියේග 12 යටතේ නිකුත්කර ඇති සහතිකය,

මෙයට අමුණමි,

ප්‍රකාශය කරන්නාගේ අත්සන : ...............................................
ප්‍රකාශය කරන්නාගේ නම : ...........................................................................
ප්‍රකාශය කරන්නාගේ තනතුර : ...........................................................................
බලපත්‍රලත් ආයතනයේ නම : ...........................................................................
දිනය : ...............................................

(අනවශ්‍ය වචන කපා දමන්න)

උපලේඛනය V

(නියෝගය 13)

*2006 අංක 11 දරන මුදල් පනත*

ටෙලිනාට්‍ය, චිත්‍රපට හා වාණිජ වැඩසටහන් බද්ද

## නිෂ්කාශන සහතිකය

බලපත්‍රලත් ආයතනයේ නම : ....................................................................................................................................................

ටෙලිනාට්‍යයේ/චිත්‍රපටියේ/වාණිජ වැඩසටහනේ නම : ....................................................................................................................................

නියෝග අංක 12 යටතේ නිකුත් කළ සහතිකයේ අනුක්‍රමික අංකය : ...........................................................................................

ඔබේ ................................. දිනැති ප්‍රකාශයේ සඳහන් ටෙලිනාට්‍ය/චිත්‍රපටය/වාණිජ වැඩසටහන, එම ප්‍රකාශයේ දක්වා ඇති දිනය/දින සහ කාල/කාලපරිච්ඡේදය තුළ විකාශය කිරීමට මෙමගින් බලය දෙනු ලැබේ.

වලංගුභාවය අවසන් වීමේ දිනය : ........................................

...............................................
දිනය

...............................................
(අත්සන)
ලේකම්, ජනමාධ්‍ය අමාත්‍යාංශය

**(අනවශ්‍ය වචන කපා හරින්න)**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.